සැ. යු.- 2012.03.16 දින පළ වූ අංක 1750 දරන ගැසට් පත්‍රයේ I-III සහ IV(A) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,751 - 2012 මාර්තු මස 23 වැනි සිකුරාදා - 2012.03.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 362 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 362 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

359 - B 80344 — 8955 (2012/03)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 අප්‍රේල් මස 23 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මාර්තු මස 02 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | කොළඹ | නිව් බසාර් කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වෙල්ලවීදිය, කොළඹ - 12. |
| කොළඹ | කොළඹ | අළුත්කඩේ කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වෙල්ලවීදිය, කොළඹ - 12. |
| කොළඹ | කොළඹ | මරදාන කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වෙල්ලවීදිය, කොළඹ - 12. |

03-854

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජාතික සමාජ සංවර්ධන ආයතනය
## (සමාජ සේවා අමාත්‍යාංශය)

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය - 2012
(ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය)
(අධ්‍යයන වර්ෂය - 2012)

සමාජ සේවා අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් ඉහත උපාධි පාඨමාලාව පවත්වනු ලැබේ. මෙම උපාධි පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

ජාතික සමාජ සංවර්ධන ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25A යටතේ අනුමත උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයකි.

(A) 2011 අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සම්පූර්ණ කළ අයගෙන් සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (2012/2016) සඳහා

හෝ

(B) සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාවේ (2011/2015) දෙවන වසර සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වූවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන ප්‍රවීණතා විභාගයකින් පසු සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

ඔබ මෙම පාඨමාලාව තෝරාගත යුත්තේ ඇයි?

මෙම පාඨමාලාව මගින් සමාජයට ඵලදායී සමාජ සේවාවක් කිරීමට පුහුණුවක් ලබාදෙයි. සමාජ වැඩ වෘත්තිකයන් සඳහා ජාතික හා ජාත්‍යන්තර තලයේ විශාල ඉල්ලුමක් ඇත. රාජ්‍ය හා රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශවල දිනෙන් දින වැඩිවන රැකියා අවස්ථාවන් ගණනාවක් පවතී.

ඔබ ඒ සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනය තෝරාගත යුත්තේ ඇයි?

සමාජ සේවා අමාත්‍යාංශයට අයත් ජාතික සමාජ සංවර්ධන ආයතනය 1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත රජයේ උසස් අධ්‍යාපන ආයතනයකි. එය සමාජ වැඩ වෘත්තීය අධ්‍යාපනය ලබාදෙන ලංකාවේ ප්‍රමුඛතම ආයතනයකි.

**පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ යුතු ආකාරය**

මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුව තමා විසින් ඉංග්‍රීසියෙන් පිළියෙල කරගත් අයදුම්පත්‍රයක් 2012.04.23 දිනට හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලිපියේ වම් කෙළවර සමාජ වැඩ උපාධි පාඨමාලාව 2012 යනුවෙන් සඳහන් විය යුතු ය :-

ලේඛකාධිකාරී,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488 ඒ, නාවල පාර, රාජගිරිය.

තව ද සම්පූර්ණ කළ අයදුම් පත්‍රය සමග අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමාජ සංවර්ධන ආයතනය නමට ලියන ලද රාජගිරිය තැපැල් කාර්යාලයෙන් මාරුකළ හැකි රු. 500ක මුදල් ඇණවුමක් ද රු. 5ක මුද්දරයක් සහිත නම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් ද එවිය යුතු ය.

වැඩි විස්තර සඳහා : 011-2882506 -11
011-3119597
www.nisd.lk

(ඉහත (A) සහ (B) යන කාණ්ඩ දෙකට අයත් අයදුම්කරුවන් පහත සඳහන් අයදුම්පත්‍රයම භාවිතා කළ යුතු ය.)

**National Institute of Social Development Application for the Bachelor of Social Work Degree Programme - 2012**

1. Full Name :————.
2. Name with Initials :————.
   (In capital letters)
3. National Identity Card Number :————.
4. Permanent Address :————.
5. Contact Tel. No. :————.
6. Sex :————.
7. Date of Birth :————.
8. Nationality :————.
9. Educational Qualifications :————.
   (i) G. C. E. (O/L)
   Index No. :————. Year :————.
   Results :————.

   (ii) (A) G. C. E. (A/L 2011)
   Index No. :————. Z Score :————.
   Results :————.
   District :————.

   (B) (to be filled by the Diploma holders/Applicants for the second year only)
   Academic year :————.
   Effective date of Diploma in Social Work :————.

   (iii) Highest Qualifications/Examination in English (If any) :————.

   (iv) Other Qualifications :————.

Copies of the result sheets of the GCE(O/L) and GCE(A/L) Examinations should be forwarded along with the application.

I certify that the information furnished by me is true and accurate. I am aware that my student-ship can be cancelled, even after the selections, if the particulars are found to be incorrect.

————.
Signature.

Date :————.

ලේඛකාධිකාරී,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2012 මාර්තු මස 11 වැනි දින.

03-899

---

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2011 (2012)**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "ලේකම්" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්" ය. "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "ශ්‍රී ලංකා පරිපාලන සේවය" ය.

2. *ලිඛිත විභාගය* :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ :-

(i) සාමාන්‍ය බුද්ධිය;
(ii) රචනය හා සාරාංශය;
(iii) සාමාන්‍ය දැනුම;
(iv) කළමනාකරණ අභියෝග්‍යතාව.

*විභාග දිනය.*-මෙම විභාගය 2012 ජුනි මස කොළඹ නගරයේ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*වාචික පරීක්ෂණය.*- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තාවූ ද අපේක්ෂකයන් සම්බන්ධයෙන් ව්‍යුහගත වාචික පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි.*-රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක

1419/3 සහ 2005 නොවැම්බර් මස 14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 ඔක්තෝබර් මස 28 වැනි දින දරන සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III වැනි පන්තියට පත්කරනු ලැබේ.

4.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයැදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

5. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය* :-

විශේෂ ශ්‍රේණිය - රු. 42,390 - 12 x 1,310 - රු 58,110.
I වැනි පන්තිය - රු. 36,755 - 17 x 1,050 - රු. 53,555.
II වැනි පන්තිය - රු. 30,175 - 8 x 790 - රු. 35,705.
III වැනි පන්තිය - රු. 22,935 - 10 x 645 - රු. 29,385.

(පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත I වැනි කාර්යක්ෂමතා කඩඉම සහ පත්වීමේ දින සිට වසර 06 ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ලබා ගත යුතුය).

මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තිය සඳහා වේ.

6. *සෞඛ්‍ය හා චරිතය*.- අපේක්ෂකයා සෞඛ්‍ය අතින් නිසි පරිදි සුදුසුකම් ලබා ඇති බවට ද, විශිෂ්ට චරිතයකින් යුක්ත බවට ද, ලේකම් සෑහීමකට පත්විය යුතු ය. ඔහු හොඳ ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය. තෝරා ගනු ලබන අපේක්ෂකයන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කෙරෙනු ඇත.

7. *සුදුසුකම්*.- මේ සඳහා පෙනී සිටින අපේක්ෂකයකු,

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු විය යුතු ය;
  (අ) උපාධිය බලපවත්නා දිනය 2011.12.31 වැනි දින හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය;
(iii) 2011.12.31 වැනි දිනට වයස අවුරුදු 28 එළඹ නොසිටිය යුතු ය;
(iv) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවකින් ද යුක්ත විය යුතු ය;
(v) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

*සටහන*.-

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට, දෙවරකට වඩා පෙනී සිටීමට කිසිවකුට අවසර නොමැත.

(ii) මෙම විභාගය සඳහා අයැදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2011.12.31 වැනි දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *විභාග ගාස්තු*.-විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතු ය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතු ය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රායෝජනවත් විය හැකිය.

9. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය*.-

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා ම පිරවිය යුතු ය. 1.0 සිට 2.12 තෙක් වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේ ද, 3.0 සිට 7.0 තෙක් එහි දෙවැනි පිටුවේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක). සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතු ය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2012.04.23 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුව (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), විභාග කොමසාරිස් ජනරාල් වෙතට එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම පිණිස වන විවෘත තරග විභාගය - 2011 (2012)" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඈ) අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය.

ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

10. *විභාගයට ඇතුළුවීම* :

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන් සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය ආරම්භයේ* පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන.-* අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත. :

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :-

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. විභාගයට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 7(ii) ඡේදයේ ඇති උපාධි සුදුසුකම් වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

15. *තෝරා ගැනීමේ ක්‍රමය.-* පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක් :

(i) සාමාන්‍ය බුද්ධිය - කාලය පැය 01 යි - ලකුණු 100 යි,
(ii) රචනය හා සාරාංශ ලිවීම - කාලය පැය 02 යි - ලකුණු 100 යි,
(iii) සාමාන්‍ය දැනුම - කාලය පැය 02 යි - ලකුණු 100 යි,
(iv) කළමනාකරණ අභියෝග්‍යතාවය- කාලය පැය 02 යි - ලකුණු 100 යි.

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

*වාචික පරීක්ෂණය* : (ලකුණු 25 යි)

ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත්තා වූ ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පුරප්පාඩු සංඛ්‍යාවට අනුකූලව ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ලකුණු සීමාවකට ඉහළින් මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ ද අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයැදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයින් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලකුණු ලබා දීමේ ක්‍රමය පත්වීම් බලධාරියා/රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ දී අනුමත කරනු ලැබේ.)

16. ලිඛිත විභාගයට පෙනී සිටියා වූ ද, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ ද, අයදුම්කරුවන් අතුරින් ඉහළම මුළු ලකුණු ලැබූ අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පත්වීම් සඳහා තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.)

17. *විෂය නිර්දේශය* :-

(i) *සාමාන්‍ය බුද්ධිය* (කාලය පැය 1 යි - ලකුණු 100 යි)

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමන සහ ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. (බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(ii) *රචනය සහ සාරාංශය ලිවීම* (කාලය පැය 2 යි - ලකුණු 100 යි)

දෙන ලද මාතෘකාවන්/තේමාවන් සමූහයක් අතුරෙන් අපේක්ෂකයා විසින් ම තෝරා ගන්නා ලද මාතෘකාවන්/තේමාවන් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය හා පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලි ව සහ නිවැරදි ව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.)

(iii) *සාමාන්‍ය දැනුම* (කාලය පැය 2 යි - ලකුණු 100 යි)

ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

(iv) *කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව* (කාලය පැය 2 යි - ලකුණු 100 යි)

ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම යනාදී වශයෙන් අපේක්ෂකයෙකු සතු විශිෂ්ට කළමනාකරණ කුසලතාවයන් ඔහුට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්ථාවයන් අනුසාරයෙන් නිර්ණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. (බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

පී. බී. අබේකෝන්,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන හා<br>
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2012 මාර්තු මස 09 වැනි දින,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,<br>
නිදහස් චතුරශ්‍රය,<br>
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2011 (2012)

Open Competitive Examination for Recruitment to class III of the Sri Lanka Administrative Service - 2011 (2012)

ඉල්ලුම්පත්‍රය

1.0 මාධ්‍යය—<br>
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය<br>
සිංහල - 2<br>
දෙමළ - 3<br>
ඉංග්‍රීසි - 4<br>
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදාහරණ* : (SILVA, A. B.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :———.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ -0, ස්ත්‍රී - 1) :<br>
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.7 විවාහක/අවිවාහක බව :<br>
අදාළ අංකය කොටුව තුළ ලියන්න.<br>
(අවිවාහක -1, විවාහක -2)

2.8 ජන වර්ගය :<br>
අදාළ අංකය කොටුව තුළ ලියන්න.<br>
(සිංහල - 1, දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3 මුස්ලිම් - 4, වෙනත් - 5).

2.9 ජාතික හැඳුනුම්පත් අංකය :

2.10 උපන් දිනය : වර්ෂය  මාසය  දිනය

2.11 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු  මාස  දින

2.12 දුරකථන අංකය (තිබේ නම්) :

3.0 ශ්‍රී ලංකා පරිපාලන සේවයට පත්කිරීම සඳහා වූ මීට පෙර පැවැත්වූ විභාගයට පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න :

| 2005 නොවැම්බර් මස 14 වැනි දින අංක 1419/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව (දැනට ක්‍රියාත්මක) 2005.01.01 දිනට පසු පෙනී සිටි වර්ෂ | | පෙනී සිටි/නොසිටි බව |
|---|---|---|
| | 2007 විවෘත | ———. |
| | 2007 සීමිත | ———. |
| | 2009 විවෘත | ———. |
| | 2009 සීමිත | ———. |
| | 2010 විවෘත | ———. |

4.0 (i) උපාධිය ලද දිනය (මෙම සුදුසුකම් ඇත්දැයි බැලීමට නිවේදනයේ 7 (ii) කරුණාකර හොඳින් කියවා බලන්න) :——.
(ii) විශ්වවිද්‍යාල/ආයතනය :———.
(iii) ලියාපදිංචි වූ අංකය :———.
(iv) බාහිර/අභ්‍යන්තර :———.
(v) උපාධිය :———.
(vi) විෂයයන් :———.
(vii) පන්තිය :———.
(viii) ඉහළ/පහළ :———.
(ix) විභාග අංකය :———.
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :———.

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :-

(ලදු පත නොගැලවෙන සේ මෙහි අලවන්න.)
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.0 *අයදුම්කරුගේ සහතිකය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක...............හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ* 9 (ඈ) පරිදි විය යුතු ය).

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන.................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

———,
(අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන)

දිනය :———.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි).

03-912

---

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/ විවෘත තරග විභාගය - 2012

මෙම නිවේදනයේ "සේවයේ" යන පදයෙන් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී.ලං.ග.සේ.) අදහස් කෙරේ.

1. *විභාග දිනය :*

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2012 ජූලි මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය :

මෙය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

3. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 1670/33 සහ 2010 සැප්තැම්බර් 10 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :*

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි එස්.එල්.1-2006 වැටුප් කාණ්ඩය අනුව,

*මාසික වැටුප් පරිමාණය :*

SL 1-2006 - රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු.53,555/-

5. සුදුසුකම් :

5.1 විවෘත තරග විභාගය

(අ) අධ්‍යාපන සුදුසුකම් :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍යය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම ;

හෝ

(ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියෙකු විය යුතු ය ;

හෝ

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතු ය ;

හෝ

(iv) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරිත්ව ආයතනයක් මගින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතු ය ;

හෝ

(v) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ ගණකාධිකරණ ආයතනයේ I වැනි වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය ;

හෝ

(vi) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ වරලත් සංගමයේ I වැනි II වැනි කොටසට අයත් පරීක්ෂණය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය ;

හෝ

(vii) එක්සත් රාජධානියේ ලේකම්වරුන්ගේ හා පරිපාලකයින්ගේ වරලත් ආයතනයේ අවසාන පරීක්ෂණය.

(ආ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

(ඇ) වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;
(iii) විවෘත තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත;
(iv) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි;
(v) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු, 5.1 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් 2012.03.23 දිනට (නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) වයස :

2012.03.23 වැනි දිනට (නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට) වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.

5.2 සීමිත තරග විභාගය

(අ) පළපුරුද්ද සඳහා වූ සුදුසුකම් :

(i) ඉහත 5.1 (අ) ඡේදයෙහි දැක්වෙන කවර හෝ සුදුසුකමක් සහිතව 2012.03.23 දිනට (නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට) රජයේ/පළාත් රාජ්‍ය සේවයේ වසර 05කට නොඅඩු සතුටුදායක, අඛණ්ඩ, ස්ථිර සේවා කාලයක් සහිත අදාළ දිනට අවම වශයෙන් වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම ;

හෝ

(ii) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත MN 1-2006(ඒ) දරන වැටුප් පරිමාණය හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර 10කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ දිනට වැටුප් වර්ධක 10ක් අවම වශයෙන් උපයා ගෙන තිබීම.

(ආ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

(ඇ) වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;
(ii) අයදුම්කිරීමට සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ නියමිත දිනයන්හි සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම;

(iii) 2012.03.23 වැනි දිනට (නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට) පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම.

(iv) සීමිත තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.

(v) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(vi) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු, 5.2 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් 2012.03.23 වැනි දිනට (නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

6. *විභාග ගාස්තු :*

විවෘත තරග විභාගයට ගාස්තුව රු.300 කි. සීමිත තරග විභාග ගාස්තුව රු.300 කි. අපේක්ෂකයෙකු විභාග දෙකටම ඉල්ලුම් කළහොත් ගාස්තුව රු.500 කි. මෙම ගාස්තුව විභාග ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පළමුව ආදායම් ශීර්ෂ 2003-02-13 යනුවෙන් බැර කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතු ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාල කොටුවෙහි ඇලවිය යුතු ය. ලදුපතෙහි ඡායාපිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(*අ*) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතු ය.

(*ආ*) ඉල්ලුම්පතේ අංක 01 සිට 04 දක්වා මුල් පිටුවේ සඳහන් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන්ම පිරවිය යුතු ය. කෙසේ වෙතත් ඉල්ලුම්පත්‍රය සකස් කරනවිට එහි ශීර්ෂය ඉංග්‍රීසි භාෂාවෙන් ද (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. (12 ඡේදය බලන්න)

(*ඇ*) විවෘත තරග විභාගය සඳහා වූ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2012.04.23 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන පිණිස පැලවත්ත, බත්තරමුල්ලේ පිහිටි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "විවෘත තරග විභාගය, ගණකාධිකාරී" යනුවෙන් පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

***සටහන :*** රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත, විවෘත තරග විභාගයට පෙනී සිටින ඉල්ලුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(*ඈ*) සීමිත තරග විභාගය සඳහා වූ ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් 2012.04.23 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන පිණිස පැලවත්ත, බත්තරමුල්ලේ පිහිටි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "සීමිත තරග විභාගය, ගණකාධිකාරී" යනුවෙන් පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

සීමිත හා විවෘත තරග විභාග දෙකටම පෙනී සිටින්නේ නම් ලිපි කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "සීමිත/විවෘත තරග විභාගය, ගණකාධිකාරී" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(*ඉ*) ඉල්ලුම්පත්‍ර ලත් බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විගසම පුවත්පත්වල දැන්වීමක් පළ කරනු ලැබේ. විභාග දිනට දින හතකටවත් කලින් ප්‍රවේශපත්‍ර නොලබන අපේක්ෂකයෙකු පහත සඳහන් විස්තර ඇතිව වහාම පැලවත්ත, බත්තරමුල්ලේ පිහිටි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැන්විය යුතු ය. (විදුලි පණිවුඩ සඳහා "විභාග" පැලවත්ත)

(i) විභාගයේ නම;
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම;
(iii) ලිපිනය;
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය සහ තැපැල් කාර්යාලය.

8. *විභාගයට ඇතුළත්වීම :*

(*අ*) අදාල විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස ඉල්ලුම්පත් සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම ඉල්ලුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාල ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත.

(*ඇ*) අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(*ඈ*) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

9. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාගශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම

අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය;

අයදුම්කරුවන්ගේ කාර්යාලයීය හැඳුනුම්පත් පිළිගනු නොලැබේ.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

12. *විභාග ක්‍රමය* :

විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

සටහන :

(i) අපේක්ෂකයින් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.
(ii) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය* :

(අ) *පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත විභාගයක්.*— මෙම ප්‍රශ්න පත්‍ර සියල්ලම අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

| | | | |
|---|---|---|---|
| 1. | මූල්‍ය ගණකාධිකරණය - I වන පත්‍රය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| 2. | මූල්‍ය ගණකාධිකරණය - II වන පත්‍රය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| 3. | පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| 4. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| 5. | විගණනය හා විමර්ශනය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| 6. | සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය | - කාලය පැය 03යි | - ලකුණු 100 |

විෂය නිර්දේශයන් මෙම නිවේදනය අවසානයේ දැක්වේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත ප්‍රශ්නපත්‍රවලින් එක් එක් විෂය සඳහා අවම වශයෙන් 40% ක ප්‍රතිශතයක් ලබා ඇත්තා වූ අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අදාල පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

15. *පත් කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය* :

විවෘත හා සීමිත තරග විභාගවලට ලිඛිත පරීක්ෂණවලින් ඉහළම ලකුණු ලබා ගෙන ඇති කුසලතා අනුපිළිවෙල අනුව හා මූලික සුදුසුකම් සපුරා ඇති අය තෝරා ගනු ලැබේ. අපේක්ෂකයින් කිහිප දෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී.ඒ.අබේසේකර,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

2012 මාර්තු මස 23 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

අයදුම්පත

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2012

OPEN/LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO GRADE III OF THE SRI LANKA ACCOUNTANTS' SERVICE - 2012

| | |
|---|---|
| විභාග අංකය :<br>(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) | |
| *විභාගයට පෙනී සිටින නගරය* | *එම නගර අංකය* |
| | |
| ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (කොළඹ - 1, යාපනය - 2)<br>* නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | |
| විභාගයට පෙනී සිටින මාධ්‍යය :<br>සිංහල - 2 , දෙමළ - 3, ඉංග්‍රීසි - 4 ☐<br>(අදාල අංකය කොටුව තුළ ලියන්න)<br>* විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | |

1.0 නම ඃ 1.1 මුලකුරු සමග නම ඃ Mr./Mrs./Miss.:———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා ඃ Mr. SILVA, A. B.

1.2 සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය ඃ | | | | | | | | | | |

2.0 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 රාජකාරී ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 රාජකාරී ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ රාජකාරී ලිපිනය ලිවිය යුතුයි. ලිපිනයෙහි වෙනසක් වුනි නම්, එය වහාම දැන්විය යුතු ය.)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය ඃ ස්ත්‍රී - 1, පුරුෂ - 2 ☐
(අදාල අංකය ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව ඃ විවාහක - 1, අවිවාහක - 2 ☐
(අදාල අංකය ලියන්න)

3.3 උපන් දිනය ඃ

වර්ෂය ඃ ☐☐☐☐ මාසය ඃ ☐☐ දිනය ඃ ☐☐

3.4 2012.03.23 දිනට වයස ඃ

අවුරුදු ඃ ☐☐ මාස ඃ ☐☐ දින ඃ ☐☐

4.0 4.1 ඔබ අයදුම් කරන්නේ විවෘත විභාගයට ද / සීමිත විභාගය ද නැතහොත් දෙකම ද යන වග
සීමිත - 1, විවෘත - 2, දෙකටම - 3 (අදාල අංකය කොටුව තුල ලියන්න) ☐

* අයදුම්කරන විභාගය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 ගෙවන ලද විභාග ගාස්තුව රුපියල් :————.

5.0 (විවෘත තරග විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් පිරවීම සඳහාය) පහත විස්තර සපයන්න.

5.1 නිවේදනයේ 5.1 ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලැබූ සුදුසුකම් :————.

5.2 එම සුදුසුකම් ලබා ගත් ආයතන :————.

6.0 (සීමිත තරග විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් පිරවීම සඳහාය) පහත විස්තර සපයන්න.

6.1 නිවේදනයේ 5.2 ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලැබූ සුදුසුකම් :————.

6.2 එම සුදුසුකම් ලබා ගත් ආයතන ඃ

(අ)

| සේවය කර ඇති දෙපාර්තමේන්තුව | තනතුර | සිට | දක්වා | කාල සීමාව |
|---|---|---|---|---|
| | | | | |

(ආ) i. සේවය/තනතුර :————.
ii. පන්තිය :————. වැනි දින සිට
iii. පන්තිය :————. වැනි දින සිට

iv. 2012.03.23 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) රජය යටතේ මුළු සේවා කාලය ඃ

අවුරුදු :————. මාස :————.

(අ) ඉහත ii හි සේවය ඃ අවුරුදු :————. මාස :————.

(ආ) ඉහත iii හි සේවය ඃ අවුරුදු :————. මාස :————.

v. 2012.03.23 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) වාර්ෂික වැටුප ඃ ........................

7.0 7.1 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගයට ඔබ පෙනී සිටි වර්ෂඃ
1. ————. 4. ————.
2. ————. 5. ————.
3. .————. 6. ————.

7.2 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට ඔබ පෙනී සිටි වර්ෂඃ
1. ————.
2. ————.
3. ————.

8.0 මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පතට අලවන්න.

| කුවිතාන්සිය ඇලවීම සඳහා |
|---|

i. අංකය :————. iii. මුදල් ගෙවූ ස්ථානය :————.

ii. දිනය :————. iv. ගෙවන ලද මුදල ඃ රුපියල් :————.

9.0 අයදුම්කරුගේ සහතිකය :

9.1 මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක .............................. හා ............................. දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීති අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසු හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි.

9.2 2012.03.23 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්දක් තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයා ගෙන ඇති බවත්, (අවවාද කිරීම හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් මම ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

10. 10.1 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :* (සීමිත තරග විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන් හා අදාළ වන විට පමණක් විවෘත තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය.) තමන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යන කාර්යාලයේ ප්‍රධානියා ආයතන ප්‍රධානියා වශයෙන් අත්සන් කළ යුතුය.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................ නැමැති අයදුම්කරු ................................. වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත 06 හි සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, 2012 ........................... මස .............. වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.
පදවිය :—————.
ලිපිනය :—————. (රබර් මුද්‍රාවකින් සනාථ කරන්න)

10.2 සහතික කිරීම.— (විවෘත තරග විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විසින් අදාළ වන විටදී පමණක් සම්පූර්ණ කළ යුතුය.)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .............................................................. නැමැති අයදුම්කරු මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී මෙහි අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
සහතික කරන අයගේ අත්සන හා මුද්‍රාව.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.

*සටහන.*—සහතික කරන අය සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, නොතාරිස්වරයෙකු හෝ වසරකට රු.230,700/-කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විය යුතුය.

### 1 වැනි පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ පත් කිරීම් සඳහා පවත්වනු ලබන විවෘත/සීමිත තරග විභාගයේ විෂය නිර්දේශ පිළිබඳ විස්තර :

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| 1 | මූල්‍ය ගණකාධිකරණය - I | 100 | 40 | පැය 03 යි. |
| 2 | මූල්‍ය ගණකාධිකරණය - II | 100 | 40 | පැය 03 යි. |
| 3 | පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය | 100 | 40 | පැය 03 යි. |
| 4 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 | 40 | පැය 03 යි. |
| 5 | විගණනය හා විමර්ශනය | 100 | 40 | පැය 03 යි. |
| 6 | සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය | 100 | 40 | පැය 03 යි. |

*විෂයය නිර්දේශයන් :*

විෂයය අංක 01 හා 02 - මූල්‍ය ගණකාධිකරණය I හා II

මූල්‍ය ගණකාධිකරණයේ අභිප්‍රාය සහ
ගිණුම් භාවිතා කරන්නන් හා ඔවුන්ට අවශ්‍ය වන තොරතුරු
ගිණුම්කරණ පිළිවෙත

ගිණුම් සමීකරණය, ද්විත්ව සටහන් පොත් තැබීම හා ගිණුම් ක්‍රම, මූලික සටහන් පොත් හා ලෙජර්, ශේෂ පිරික්සුම, සමුච්චිත පූර්ව ගෙවීම් හා ගැලපුම්, ප්‍රාග්ධන හා ආදායම් වියදම්, ක්ෂය වීම්, අවිනිශ්චිත ගිණුම් හා වරද නිවැරදි කිරීම, පාලන ගිණුම, සැසඳුම් ප්‍රකාශන, අසම්පූර්ණ වාර්තා

අවසාන ගිණුම් :

නිෂ්පාදන ගිණුම්, වෙළඳ ලාභලාභ ගිණුම්, ශේෂ පත්‍රය, අරමුදල් ගැලීම් ප්‍රකාශනය සහ විසර්ජන ගිණුම

හවුල් ව්‍යාපාර ගිණුම් :

හවුල් ව්‍යාපාර ගිවිසුම්, හවුල් ව්‍යාපාර හා සම්බන්ධ පොත් තැබීම පිළිබඳ කරුණු, ස්ථාවර ප්‍රාග්ධන ගිණුම්, ජංගම ගිණුම්, ණය ගිණුම්, ආපසු ගැණුම් ගිණුම, හවුල් අවසාන ගිණුම් පිළියෙල කිරීම, හවුලක සංයුතියේ වෙනස්කම් - හවුල්කරුවන් ඇතුළත් කර ගැනීමේ දී හා ඉවත් කිරීමේදී කීර්තිනාමය හා අනිකුත් වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, හවුල් විසුරුවා හැරීම, බද්ධ ව්‍යාපාර

සීමාසහිත සමාගම්වල ගිණුම් :

සීමාසහිත සමාගම්වල ස්වභාවය, නිල ලැයිස්තුගත සමාගම හා කොටස් වෙළඳ පොළ/කොටස් හා ණය ප්‍රාග්ධනය, බෙදිය හැකි

ලාභ, අභ්‍යන්තර හා බාහිර ප්‍රයෝජනය සඳහා අවසාන ගිණුම්, ගිණුම් ප්‍රකාශ අර්ථකථනය, ගිණුම් කට්ටලයක් විවරණය කිරීම, ගිණුම් අනුපාතයන්

විශේෂිත ගනුදෙනු සඳහා ගිණුම් :

සමිති හා සමාගම්, තොග, ශාඛා, කුලී සින්නයට මිලදී ගැනීම හා ණයට විකිණීම, කල් බදු දීම, ආයෝජන, විනිමය බිල්පත්, දීර්ඝ කාලීන කොන්ත්‍රාත්තු, රාජ්‍ය භාග, හිස් භාජන ගිණුම්, විදේශ මුදල් ගනුදෙනු

ගිණුම්කරණය සඳහා පරිගණක යොදා ගැනීම :

පරිගණක වර්ග/දෘඩාංග හා මෘදුකාංග, පරිගණක කාර්ය බද්ධ මෘදුකාංග, විද්‍යුත් කාරක විස්තර පත්‍රය, පරිගණකමය ගිණුම්කරණය

විෂයය අංක 03 - පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය :

පිරිවැය ගණකාධිකරණය, මූල්‍ය ගණකාධිකරණය හා කළමනාකරණ ගණකාධිකරණය,
පිරිවැය ගණකාධිකරණයේ අභිප්‍රාය,
ගණකාධිකරණය කළමනාකාරිත්ව සහායක් වශයෙන් යොදා ගැනීම

ද්‍රව්‍ය පිරිවැය :

මිලදී ගැනීම් පිළිවෙත්, ගබඩා පිළිවෙත්, ද්‍රව්‍ය නිකුත් කිරීම ඇගයීමේ ක්‍රම, දිරි දීමනා හා ප්‍රසාද දීමනා

ශ්‍රම පිරිවැය :

වේලා සටහන් කිරීම් හා වේලා වෙන් කිරීම්, වැටුප් ගෙවීම් ක්‍රම, දිරි දීමනා හා ප්‍රසාද මුදල් ගෙවීම, වේතන හා වැටුප් ගිණුම් තැබීම

පොදු කාර්ය පිරිවැය :

වර්ගීකරණ වෙන් කිරීම් හා බෙදා හැරීම්, අවශෝෂණ ක්‍රම, පොදු කාර්ය පරිපාලනය, වෙළඳාම් හා බෙදා හැරීම් පොදු කාර්ය පිරිවැය

ඒකාබද්ධ හා ඒකාබද්ධ නොවන ගිණුම් :

පිරිවැය පාලන ගිණුම, පිරිවැය හා මූල්‍ය ගිණුම් සැසඳීම්, පූර්ණ ගිණුම්

පිරිවැයකරණ ක්‍රම :

කොන්ත්‍රාත් පිරිවැයකරණය, කාර්ය පිරිවැයකරණය, දෙපාර්තමේන්තුමය පිරිවැයකරණය, භාණ්ඩ පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ඒකක පිරිවැයකරණය, සේවා පිරිවැයකරණය, විවිධ පිරිවැයකරණ ක්‍රම යටතේ උපලබ්ධි නොවූ ලාභ

ආන්තික පිරිවැයකරණය :

දායකවීම්/විකුණුම්, සමච්ඡේදන සටහන්, ආන්තික පිරිවැයකරණය යොදා ගැනීම, ආන්තික පිරිවැයකරණය හා සම්බන්ධ ගිණුම් සටහන්

ප්‍රමිති පිරිවැයකරණය :

ප්‍රමිති පිරිවැය, තථ්‍ය පිරිවැය, මූලික විචලනයන්, ගිණුම්කරණ පරිපාටිය

අයවැය පාලනය :

ශ්‍රීතගත අයවැය, ප්‍රධාන අයවැය, නම්‍ය අයවැය පාලනය, අඛණ්ඩ අයවැයකරණය, අයවැය පාලනය මෙහෙයුම

විෂයය අංක 04 - රාජ්‍ය මූල්‍ය කළමනාකරණය :

රජයේ මුදල් පිළිබඳ නෛතික රාමුව :

ඒකාබද්ධ අරමුදල, විශේෂ නීති විෂයගත වියදම්, ප්‍රතිශ්චිත අවසාන අරමුදල, රාජ්‍ය ණය, විදේශ ආධාර, මූල්‍යමය පියවර

කාර්යභාරය

පාර්ලිමේන්තුවේ, මුදල් අමාත්‍යවරයාගේ, භාණ්ඩාගාරයේ, විගණකාධිපතිවරයාගේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ, ප්‍රධාන ගණක නිලධාරියාගේ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ, මුදල් මණ්ඩලයේ

වාර්ෂික විසර්ජන කෙටුම්පත :

අයවැය ක්‍රමය හා පටිපාටි/වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු

අයවැය ක්‍රියාත්මක කිරීම :

අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ව්‍යුහය, ආදායම් රාශිකරණ පටිපාටිය, ගෙවීම් කිරීම සඳහා අග්‍රිමය, මූල්‍ය කටයුතු මෙහෙයුම් අධීක්ෂණය, කාර්ය පැවරුම, වීරමොං පටිපාටිය, පරිපූරක ඇස්තමේන්තු, අයවැය පාලනය, සැපයීම් පටිපාටිය

රජයේ ගිණුම් ක්‍රමය හා පටිපාටි :

රජයේ දේපළ භාරය, ආරක්ෂාව හා පාලනය, ආදායම් හා අනිකුත් ලැබීම් සඳහා ගිණුම්කරණය, වියදම් හා අනිකුත් ගෙවීම් සඳහා ගිණුම්කරණය, විදේශ ආධාර සඳහා ගිණුම්කරණය, පාඩු අත්හැරීම් හා කපා දැමීම් සඳහා ගිණුම්කරණය

සමාලෝචනය :

ක්ෂණික වාර්තා, මාසික ගිණුම් සාරාංශය, මූල්‍ය හා භෞතික කාර්යය සාධන සමාලෝචනය, වාර්ෂික විසර්ජන ගිණුම, දිවයිනේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව, රජයේ ගිණුම් කාරක සභාවේ වාර්තාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ වාර්තාව

විෂයය අංක 05 - විගණනය හා විමර්ශනය :

විගණනයේ ස්වභාවය හා පරමාර්ථය - විගණකගේ කාර්යභාරය :

අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, ව්‍යවස්ථාපිත - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1971 අංක 38 දරන මුදල් පනත යටතේ රජයේ දෙපාර්තමේන්තුවලට, අමාත්‍යාංශවලට හා සංස්ථාවලට අදාලව ව්‍යවස්ථාමය නොවන - 1982 අංක 17 දරන සමාගම් ආඥාපනත යටතේ, විගණන ප්‍රමිති, විගණන මත, විගණන සංකල්ප, විගණකගේ ස්වාධීනත්වය හා අනිකුත් පෞද්ගලික ගුණාංග, සාක්ෂි, සත්‍යවාදී සාධාරණ බව, භෞතිකත්වය, විගණන අවදානම්, විගණකගේ වගකීම්, විගණනයට භාජිතගේ වගකීම්

විෂය ක්ෂේත්‍රය හා සීමාවන් :

විෂය ක්ෂේත්‍රය නිර්ණය කිරීම, උපකල්පනයන් හා සීමාවන්

විගණන ප්‍රමිතිවල හා මාර්ගෝපදේශවල කාර්යභාරය :

සේවයේ යෙදීමේ ලිපිවල, කළමනාකරණ ලිපිවල හා නියෝජන ලිපිවල කාර්යභාරය, මූලික විගණන ක්‍රම විධි හා සමාලෝචනය සඳහා පටිපාටි අභ්‍යන්තර පාලනය ඇගයීම

ප්‍රමාණ සටහන්, ප්‍රශ්න මාලා

විගණන සැලසුම් කිරීම් හා පාලනය

විගණනය සැලසුම් කිරීම, කාල නිර්ණය, අන්තර් හා අවසාන විගණන, කාර්යයන් සඳහා වගකීම් භාරදීම, විගණන පාලනය, අභ්‍යන්තර පාලනය යොදා ගැනීම් ඇතුළුව කල වැඩ සටහන්ගත කිරීම, සකස් කල ප්‍රශ්න මාලා හා අභ්‍යන්තර පාලනය ඇගැයීමේ ආකෘතිපත්‍ර

මූල්‍ය විගණනය සඳහා අගයන්, සංකල්ප හා ලක්ෂණ :

එය රාජ්‍ය අංශයට අදාල බව, විශ්ලේෂණාත්මක විගණනය

පරිගණකගත කළ ගිණුම් පද්ධති විගණනය - සීමාසහිත සමාගම් විගණනය

ව්‍යවස්ථාපිත පොත්, අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා රාජකාරීන්, බෙදිය හැකි ලාභ, විගණකයින් පත් කිරීම, වේතන හා ඉවත් කිරීම්, නව විගණකයන් භාර ගැනීමට ප්‍රථම ගත යුතු ක්‍රියාමාර්ග, විගණකගේ බලතල හා යුතුකම්

පරීක්ෂණවල ස්වභාවය හා ප්‍රමාණය

අනුකූලතා පරීක්ෂණ, ස්වාධීන පරීක්ෂණ, නියැදි ශිල්ප ක්‍රම, ශේෂ පත්‍ර සමීක්ෂණය, ආදායම් හා වියදම් ගිණුම් සමීක්ෂණය

විගණකයින්ගේ හා ගණකාධිකාරීවරුන්ගේ වෘත්තීමය වගකීම්

වෘත්තීමය පැවැත්ම හා ආචාර ධර්ම, නෛතික අයිතීන් හා වගකීම්, ගණකාධිකාරීගේ හා විගණකගේ නීතිමය වගකීම හා සිද්ධීන් පිළිබඳ දැනුම් විෂයයට අදාල නීතිය

විමර්ශන :

විමර්ශනයට අදාල විෂය ක්ෂේත්‍රයේ සැලසුම් කිරීම, භාවිතා කළ යුතු ශිල්ප ක්‍රම හා පිළිවෙත්, විමර්ශන මෙහෙයවීමේ අභිප්‍රාය පිළිබඳ උදාහරණ, සක්‍යතා අධ්‍යන, මිලට ගැනීම්, විකිණීම, ණයට දීමේ, මිල නියම කිරීම ආදිය සඳහා ව්‍යාපාර ආයතන ඇගයීම, කාර්ය පත්‍රය සඳහා ගණකාධිකාරීගේ හා විගණකගේ වාර්තා, වාර්තාකරණ කාර්යයන්, වංචා විමර්ශන, ව්‍යාපෘති ඇගැයීම

වාර්තාකරණ කාර්යයන් :

අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා කළමනාකරණයට වාර්තා කිරීම, රජයේ හා සංස්ථා විගණනයට ලිඛිතව විශේෂ වාර්තාකරණය කාර්යය, කාර්ය පත්‍රය සඳහා වාර්තා, විමර්ශනය පිළිබඳ වාර්තා

**විෂයය අංක 06 - සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය**

*'අ' කොටස*

අවබෝධය ප්‍රශ්න පත්‍රයේ දෙනු ලබන ඡේදයක් පදනම් කොටගෙන අයදුම්කරුවන්ගෙන් ප්‍රශ්න අසනු ලැබේ. තවත් ඡේදයක් දෙනු ලබන අතර, අයදුම්කරුවන් විසින් එහි මුඛ්‍ය අදහස ඡේදයේ වචන ගණනින් තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවිය යුතුය.

*'ආ' කොටස*

බුද්ධිය

සටහන :

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති "සුදුසුකම් ලත් විභාගය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක්ය.
(ii) අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.
(iii) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් ය.

(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේදී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදා ගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත්, අතිරේක විෂය තවත් භාෂාවකිනුත්, සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

03-1028

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.